## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා

## ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධන අංක - 01

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනය කිරීමට හේතුව |
|---|---|---|---|---|
| **7** | **බඳවා ගැනීමේ ක්‍රමය** | **7** | **බඳවා ගැනීමේ ක්‍රමය** | |
| **7.3** | **මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියට බඳවා ගැනීම** | **7.3** | **මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියට බඳවා ගැනීම** | |
| 7.3.1 | විවෘත බඳවා ගැනීම | 7.3.1 | විවෘත බඳවා ගැනීම | |
| 7.3.1.3 | වයස | 7.3.1.3 | වයස | |
| 7.3.1.3.1 | අවම වයස සීමාව : අවුරුදු 21 යි | 7.3.1.3.1 | අවම වයස සීමාව : අවුරුදු 21 යි | දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තිය සඳහා අයදුම් කිරීමට අදාළ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති එහෙත් මෙම තනතුරට අයදුම් කිරීමට නියමිත වයස සීමාව ඉක්මවා ගොස් ඇති, දැනටමත් මධ්‍යම පළාත් සභාවේ ආයතනවල පරිගණක ක්ෂේත්‍රයට අදාළ කටයුතු වල නිරත වෙමින් තම පරිගණක දැනුම කිසිදු වේතනයක් නොලබා ලබා දෙන නිලධාරීන්ට මෙම තනතුර සඳහා අයදුම් කිරීමට හැකි වන පරිදි. |
| 7.3.1.3.2 | උපරිම වයස සීමාව : අවුරුදු 35 යි | 7.3.1.3.2 | උපරිම වයස සීමාව : අවුරුදු 35 යි | |
| | | 7.3.1.3.3 | දැනටමත් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින තනතුරේ ස්ථිර කර ඇති නිලධාරීන්ට 7.3.1.3.1 හා 7.3.1.3.2 හි සඳහන් වයස් සීමාවන් අදාළ නොවේ. | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.03.02 දින
අනුමත කරන ලදී

ඩී. එම්. සී. අයි. දිසානායක
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
මධ්‍යම පළාත.

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනය කිරීමට හේතුව |
|---|---|---|---|---|
| **14** | **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම** | **14** | **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම** | |
| 14.1 | අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ 2011.02.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011, 2012.08.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(i) සහ 2014.08.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(ii) චක්‍රලේඛවල විධිවිධාන පරිදි සේවයට අන්තර්ග්‍රහණය කරනු ඇත.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් [illegible] දින අනුමත කරන ලදී<br>ඩී. එම්. සී. අයි. දිසානායක<br>පරිපාලන නිලධාරී<br>ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,<br>මධ්‍යම පළාත. | 14.1 | (I) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III ශ්‍රේණියේ සියලුම නිලධාරීන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. අන්තර්ග්‍රහණය හේතු කොට ගෙන නිලධාරීන්ගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.<br><br>(II) මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට හා I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම අදාළ නොවේ. | 2016.11.12 වන දින පවත්වන ලැබූ මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ ප්‍රතිඵල අනුව 2018.09.17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇති නිලධාරීන් පිරිසක් සිටීම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013.01.01 දින සිට මේ දක්වා අනුමත කරන ලද මධ්‍යම පළාත් කාර්ය මණ්ඩල වාර්තාව අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 11 ක් වැනි සීමිත තනතුරු සංඛ්‍යාවක් අනුමතව පැවතීම.<br><br>මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගෙන නොමැති නිසා අන්තර්ග්‍රහණය කිරීම අවශ්‍ය නොවේ. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013.01.01 දින සිට මේ දක්වා අනුමත කරන ලද මධ්‍යම පළාත් කාර්ය මණ්ඩල වාර්තාව අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු 06 ක් වැනි සීමිත තනතුරු සංඛ්‍යාවක් අනුමතව පැවතීම. |

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

01. පී.ජී. අමරකොන් මහතා (සභාපති) ..............................

02. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..............................

03. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................

04. එන්.ඩී.කේ. පියුම්සිරි මහතා (සාමාජික) ..............................

05. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..............................

06. කේ.ආර්. ක්‍රිෂාන් මහතා (සාමාජික) ..............................

07. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................

දිනය 2020 . 05 . 26

ආණ්ඩුකාර ලේකම්,

2020 . 05 . 26 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2020 / 450 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක - 01 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2020 . 06 . 11

..............................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත

නිල මුද්‍රාව

ඩී.ඒ.ඩී.ඩබ්ලිව්. දයානන්ද

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත

අනුමත කරමි / නොකරමි

නීතිඥ ලලිත් යූ. ගමගේ

ආණ්ඩුකාරවර

මධ්‍යම පළාත

2021 . 03 . 02

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.